# රඟ මඬල

කලාභූෂණ ගත්කතුවර, සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී
**ලයනල් ගුණතිලක ලියයි**



**ශ්‍රී ලංකාවේ ටවර් හොල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව**

## ඇල්.ඩී.ඒ. රත්නායක

පසුගිය කලාප ද්විටියෙන්ම ඔබගේ අවධානයට යොමු කරන ලද්දේ නාට්‍ය කතුවරයෙකු මෙන්ම ගීත නිබන්ධයෙකු වූ ඩී.ඇල්.බෝධිපාල සූරින් පිළිබඳවයි. එමෙන්ම එදා යුගයේ සිටි තවත් විශිෂ්ට නාට්‍ය කතුවරයෙකු පමණක් නොව, ගායකයෙකු, නළුවෙකු මෙන්ම පේරි ඇඳුම් මසන්නෙකු හා ඉතිහාසඥයෙකු වූ ඇල්.ඩී.ඒ. රත්නායක සූරින් පිළිබඳව තොරතුරු බිඳක් මෙම ලිපියෙන් විමසා බලමු.

රත්නායක මුදියන්සේලාගේ කරෝලිස් රත්නායක හා වෙල්ලස්සේ විජේසුන්දර ආරච්චිලාගේ රන්මැණිකේ හාමිනේගේත් කනිෂ්ඨ පුත්‍ර රත්නය, අපගේ කතානායකයායි. ලිවර්පෝල් ආර්නෝල්ඩ් රත්නායක නම් හෙතෙම ජන්ම ලාභය ලබන්නේ ක්‍රි.ව. 1899 අප්‍රේල් 01 වැනි දිනදීය. එකල බෙහෙවින් ජනප්‍රිය වූයේ පිරිවෙන් අධ්‍යාපනයයි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන්, කුරුණෑගල ඇත්කඳ විහාරයේ ශ්‍රී සරණංකර හිමිපාණන් හා ලේල්වල සිරි නිවාස යන ගෞරවණීය හිමිවරුන්ගෙන් අධ්‍යාපනය ලබා තිබේ. පසුකළ ලක්බිම පුවත්පතේ කතෘ තැන්පත් මාතර ඇම්. ධර්මරත්න පඬිතුමාගෙන්ද සංස්කෘත පාලි සිංහල යන භාෂා හදාරා තිබේ.

බාල කාලයේ සිටම දැඩි ඇල්මක් දක්වා තිබෙන්නේ සංගීතයට, කවි ගායනයට, දොරකඩ අස්න ගානයට, මෙන්ම නාට්‍ය කලාවටයි. 1910 සිට 1916 දක්වා කාලවකවානුවක් තුල වෙසක්, නත්තල්, කැරොල් ගායනය වලටද, නාඩගම් රඟ මඩලවල, ළමා ගායන හා නැටුම් සඳහාද යොමුවිය. උච්චස්වරයෙන් ගීත ගායනා කිරීමේ හැකියාව නිසා ඉතා ජනප්‍රිය කලාකරුවෙකු ලෙස ජනාදරයට පත් වී ඇත.

1912 දී පමණ ටවර් හෝල් හි කොළඹ සිංහල නාට්‍ය සභාව හිමි බී.ජේ.පෙරේරා මහතාගේ මෙහෙයවීම පිට ආර්.ජෝන් පෙරේරාගේ නාට්‍යවල නාට්‍ය පිටපත් කිරීමේ කටයුතුවල නිරතවිය. එසේම එකල ඉතා ප්‍රසිද්ධ නාට්‍යකරුවෙකු වූ සි. දොන් බස්තියන් ජයවීර බණ්ඩාර සූරීන් හා නීතීඥ ජෝන්ද සිල්වා සූරීන් ඇසුරට පත් මොහු සංගීත වාදීහසිංහ එඩ්වඩ් සයිමන් පතිරාජා, ජේ.ඩී.මාෂල් පෙරේරා හා ජෝගි පැලිස් අප්පුහාමි යන නාට්‍ය සංගීත ඇදුරන්ගෙන් උපදෙස් ලබාගෙන තිබේ.



පසුකල මැඩ්රාස්හි ක්‍රිෂ්ණමූර්ති භාගවතාර්ගේ නළු නිළි සංගමයට බැඳී ඉන්දියාව ඇතුළු පෙරදිග රටවල වර්ෂ 02 ක පමණ කාලයක් නිරත වී විවිධ වේදිකා ක්‍රම හදාරා ලක්දිවට පැමිණ එම ශිල්පීය ඥානය සිය නාටක සඳහා උපයෝගී කරගෙන තිබේ.

දොරෙයි සින්නයියා ශෝක්කලිංගම් ආර්. ජෝන් පෙරේරා, ටී.මැන්දිස් පෙරේරා යන ගුරුවරුන්ගෙන් නාඩගම් රචනා ඉගෙනගෙන නාඩගම් ග්‍රන්ථ 25 ක් පමණ රචනය කර රඟ දක්වා තිබේ.

1912 සිට 1915 දක්වා කාලය තුල නීතීඥ ජෝන් ද සිල්වා සූරීන් විසින් අරඹන ලද අමද්‍යප ව්‍යාපාරයට සම්බන්ධ වී සුරාපානයේ ආදීනව විදහා දක්වන ගීත ගායනයෙන් ජාතිය අවදි කළේය.

1912 සිට 1931 දක්වා අනගාරික ධර්මපාලතුමාගේ උපදෙස් පරිදි 'බුද්ධගයාව' බේරාගැනීමේ ජාතික සටනට සහය දක්වමින් 'බුද්ධගයා' නමින් නාට්‍ය ව්‍යාපාරයක් ලක්දිව පුරාම ව්‍යාප්ත කිරීමට සිය කාලය යෙදවීය. 1918 සිට 192 වන තෙක්ම ආගමික මෙන්ම සමාජමය සේවාවන් රාශියක් සම්බන්ධ අධ්‍යාපනික මධ්‍යස්ථානවල නිලතල දරමින් කටයුතු කළේය.

ග්‍රැමෆෝන් තැටි සමාගම් වන, ඕඩියන්, එච්.ඇම්.වී. 'කොලොම්බියා' යන සමාගම් සඳහා සංගිතමය නාට්‍ය ගණනාවක් රචනා කර එවක සිටි ප්‍රසිද්ධ ගායක ගායිකාවන් ලවා ගායනා කරවා ජාතියට ඉමහත් සේවාවක් කර තිබේ. නම් වශයෙන් සඳහන් කරන්නේ නම් 'පොළිකාරයා' 'ස්වර්ණ මාලි', විධුර යන කෘති ඒ අතර වේ.

එතුමන් විසින් ජාතිය වෙනුවෙන් තිළිණ කරන ලද නාට්‍ය සංඛ්‍යාව සියයකට අධිකය. ඒ පිළිබඳවත් එතුමන්ගේ වෙනත් විෂයන් කිහිපයක රසවත් විස්තර සහිත තොරතුරු ඊළඟ කලාපයෙන් බලාපොරොත්තු වන්න.

පැරණි කලාකරුවන් පිළිබඳව යලි ආවර්ජනයක යෙදීම තුලින් අප අපේක්ෂා කරනුයේ එම විශිෂ්ට කලාකරුවන්ට ගරු කිරීමය. තවදුරටත් පැහැදිලි කරන්නේ නම් වත්මනයේ මෙන් ජනසන්නිවේදන මාධ්‍ය නොදියුණු සමයක ඔවුන් විසින් සිදුකර තිබෙන අනුපමය මෙහෙවර නව පරපුරට වටහාදීමත් එම ආදර්ශය තුල පිහිටා හරවත් රසවත් කලාකෘතීන් ජාතියට තිළිණ කිරීමට වත්මන් උගත් කලාකරුවන් පෙළඹවීමත් යන දෘඩතර ක්ෂාන්තිවාදී අධිෂ්ඨානයෙන් බව කරුණාවෙන් සළකන්න.

ලිපිය සැකසීමේදී එල්.ඩී.ඒ. රත්නායක ශූරීන්ගේ පුත් ආර්.එම්.ඒ.රත්නායක මහතාගේ ශ්‍රී ලංකාවේ නාට්‍යකරුවන් යන කෘතිය බෙහෙවින් උපකාර වූ බව ගෞරවයෙන් සිහිපත් කරමි.

**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com